# ළමා ග්‍රන්ථ නාමාවලිය

## 1989 - 1990

ප්‍රකාශනය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

253.19

# ළමා ග්‍රන්ථ නාමාවලිය

## 1989-1990

# ළමා
# ග්‍රන්ථ නාමාවලිය
## 1989-1990

සම්පාදනය
නාලිනී ද සිල්වා

ප්‍රකාශනය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

මුද්‍රණය 1993

© ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

ISBN 955-9011-67-7

Bibliography of children's books
(An Annotated Bibliography)

Compiled by
**Nalini De Silva**

Publisher
National Library of Sri Lanka,
P.O. Box. 1764,
Independence Avenue,
Colombo 07.
Sri Lanka.

මුද්‍රණය
සීමාසහිත යුනයිටඩ් මර්චන්ට්ස්
කොළඹ - 13

# පටුන


පෙරවදන

සංක්ෂිප්ත වචන මාලාව

ග්‍රන්ථ නාමාවලිය 1

ග්‍රන්ථ නාම අනුක්‍රමණිකාව 79

# පෙරවදන

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් පල කරනු ලබන ළමා ග්‍රන්ථ නාමාවලී ග්‍රන්ථ මාලාවේ දෙවන ප්‍රකාශනය ඉදිරිපත් කරනුයේ සතුටිනි. මෙම ග්‍රන්ථ මාලාවේ පළමු ප්‍රකාශනය 'ළමා ග්‍රන්ථ නාමාවලිය 1988' මැයෙන් මීට ඉහතදී ප්‍රකාශයට පත් විය. 1988 වසරේ ශ්‍රී ලංකාවේ පළවූ ළමා ග්‍රන්ථ පිළිබඳ තොරතුරු එයින් දැක්විනි. මෙයට ඉතා හොඳ ප්‍රතිචාරයක් පාඨකයන්ගෙන් ලැබීම මෙම ප්‍රයත්නය තවදුරටත් ඉදිරියට ගෙන යාමට විශාල අනුබලයක් විය. 'ළමා ග්‍රන්ථ නාමාවලිය 1989-1990' , නමැති මෙම ප්‍රකාශනයෙන් අදාල වර්ෂ 02 තුල ශ්‍රී ලංකාවේ පලවූ ළමා ග්‍රන්ථ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ. නීතිමය තැන්පතු නීතිය යටතේ සහ මුද්‍රිත පොත් මිලදී ගැනීමේ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට ලැබුණු ප්‍රකාශන මෙහිදී ප්‍රධාන වශයෙන්ම උපයෝගී කර ගෙන ඇත.

මීට පෙර පලවූ ළමා ග්‍රන්ථ නාමාවලිය මෙන්ම මෙම ළමා ග්‍රන්ථ නාමාවලියද සංස්කරණය සහ සම්පාදනය කරන ලද්දේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ග්‍රන්ථ විඥාපන සේවා අංශයේ අංශ ප්‍රධාන වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ නාලිනී ද සිල්වා මහත්මිය විසිනි. මෙම කාර්යය ඉතා උනන්දුවෙන් හා මැනවින් ඉටු කිරීම පිළිබඳව ඒ මහත්මියට සැමගේ කෘතඥතාවය හිමි විය යුතුය. එසේම මේ කාර්යයේදී ඒ මහත්මියට සහාය වූ සුමනා ඇල්ලෙපොල මහත්මිය සහ ග්‍රන්ථ නාමාවලී අංශයේ කේ. ඒ. පී. අප්පුහාමි මහතා, චන්ද්‍රිකා මල්ලවආරච්චි මෙනෙවිය, චම්පා නන්දිකා කුමාරසිංහ මෙනෙවිය සහ ඩී. එච්. අසෝකා දමයන්ති මහත්මියටත් කෘතඥ වෙමි. එසේම මෙම ග්‍රන්ථයේ පිටකවරය සැලසුම් කළ ඊ. එම්. ඩී. උපාලි මහතාටත්, ප්‍රකාශන කටයුතු උනන්දුවෙන් ඉටුකළ මණ්ඩලයේ ප්‍රකාශන අංශයේ සහකාර පුස්තකාලයාධිපති එම්. ඒ. මිල්ටන් මහතාටත්, මුද්‍රණ කටයුතු කළ සීමාසහිත යුනයිටඩ් මර්චන්ට් මුද්‍රණාලයටත් ස්තුතිවන්ත වෙමි.

එම්. එස්. යූ. අමරසිරි
අධ්‍යක්ෂ.

1993 ජුනි

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය,

නිදහස් මාවත,

කොළඹ 07.

# සංක්ෂිප්ත වචන මාලාව

| | | |
|---|---|---|
| අ. වි. | - | අතිරේක විෂය |
| ක. | - | කලාපය |
| කක. | - | කඩදාසි කවරය |
| කබැ. | - | කම්බි බැම්ම |
| කා. | - | කාණ්ඩය |
| කාබෝක. | - | කාඩ්බෝඩ් කවරය |
| තැ.නො. | - | තැන නොදැක්වේ |
| නූබැ. | - | නූල් බැම්ම |
| පරි. | - | පරිවර්තක |
| පි. | - | පිටු |
| ප්‍ර.නො. | - | ප්‍රකාශක නොදැක්වේ |
| බෝක. | - | බෝඩ් කවරය |
| මැබැ. | - | මැලියම් බැම්ම |
| රෙක. | - | රෙක්සින් කවරය |
| රෙබැ | - | රෙදි බැම්ම |
| සම්පා. | - | සම්පාදක |
| සිබැ. | - | සිදුරු බැම්ම |
| සෙම්. | - | සෙන්ටි මීටරය |
| සංස්. | - | සංස්කාරක |




1. අන්ද්‍රාහැන්නදි, ක්‍රිෂාන්ති
   මහ පොළොව දෙදරයි / ක්‍රිෂාන්ති අන්ද්‍රාහැන්නදි විසිනි.- ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය, 1990. - පි. 12 : චිත්‍ර : සෙමී 20 × 13.
   කබැ - බෝක: මිළ නොදැක්වේ. වයස අවු. 8-12.

   ගස් කැපීමේ ආදීනව දක්වන කථාවකි. පාසැල් ශිෂ්‍යාවකගේ කෘතියකි.




2. අබේසිංහ, කල්‍යාණී
   රන් රඹුටන් ගස් දෙකයි / කල්‍යාණී අබේසිංහ විසිනි.-කොළඹ 10 (675, මරදාන පාර): ඇස්. ගොඩගේ, 1990.- පි. 11: චිත්‍ර: සෙමී 23 ×17.
   කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.6-14.
   ISBN 955-20-0415-2

   මහ පොළොව කාටත් අයිති බවත්, ඒ සඳහා රණ්ඩු දබර වීම මෝඩ වැඩක් බවත් කියැවෙන කථාවකි.




3. අබේසිංහ, ඩබ්ලියු. ඒ.
   ගී සින්දුඃ ස්වර ලිපි සහිත ළමා ගීත සංග්‍රහය/ ඩබ්ලියු. ඒ. අබේසිංහ විසිනි. - කුලියාපිටිය. (68, පන්නල පාර): රත්නා මැණිකේ අබේසිංහ, 1989. - පි. 112 : චිත්‍ර : සෙමී 22.
   මැබැ-බෝක: රු. 60.00. වයස අවු. 12-18.

   ළමා ගීත 42 ක් ද ඒවායේ ස්වර ලිපි ද සහිතය.



4. අබේසිංහ, ඩබ්ලියු. ඒ.

හා හා හරි හාවා සහ වෙනත් කතා / ඩබ්ලියු. ඒ. අබේසිංහ විසිනි. - පන්නිපිටිය (94/1 අතුරුගිරිය පාර, කොට්ටාව) : සාර ප්‍රකාශන සහ මුද්‍රණය, 1990.- පි. 36 :
චිත්‍ර : සෙමී 21 × 13.
කබැ-බෝක : රු. 25.00. වයස අවු. 8-10.
ISBN 955-553-043-2

හා හා හරි හාවා, මහ ලෝබයා, සිංහයා සහ මදුරුවෝ, දියමන්ති පොරව යන කෙටි කථා හතරේ එකතුවකි. විදේශීය ජන කථාවල පරිවර්තනයකි.



5. අබේසිංහ, ලාලනී

චූටියි බට්ටිච්චයි / ලාලනී අබේසිංහ විසිනි. - කොළඹ (තැ.පෙ.1946): කොළඹ පොත් සංගමය, 1989. - පි. 12 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක : රු.12.50. වයස අවු. 8-10
ISBN 955-588-083-2

කුඩා දැරියක හා ඇගේ යහළුවන් වූ ඉර, වළාකුළු, සුළඟ හා වැස්ස පිළිබඳ ලියවුන කථාවකි.





6. අමරරත්න, ඇල්. ඇස්. ඊ.

කුමාරෝදය / ඇල්. ඇස්. ඊ. අමරරත්න විසිනි.- කොළඹ 11 (217, ඕල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන, 1990. - පි. 67 :
චිත්‍ර : සෙමී 19 × 12.
කබැ-බෝක : රු. 24.50. වයස අවු. 7.
ISBN 955-21-0146-8

කවි සහ කථන්දර සහිත පාඩම් පොතකි.

7. අමරත්න, ඇල්. ඇස්. ඊ.




පුදුම බෙහෙත සහ වෙනත් කථා / ඇල්. ඇස්. ඊ. අමරරත්න විසිනි. - කොළඹ 11, (217, ඕල්කොට් මාවත) : 1990. - පි. 68 :
චිත්‍ර : සෙමී 17 × 12.
කබැ-බෝක : රු. 38.50. වයස අවු. 10-16.
ISBN 955-21-0295-2

පුදුම බෙහෙත, උපාදත් මකුළුවා, මදුරුවනට වූ විපත, පරිසියස්, ගොයම් ගසෙක හා තිරිඟු ගසෙක කථාව සහ අශ්වයකුගේ කථාව යන කථාවල එකතුවකි.

8. අමරසේකර, රූපා



රත්තරන් හංසයා / රූපා අමරසේකර විසිනි. – රාජගිරිය (මැද වැලිකඩ පාර) : අනුර සී. ප්‍රින්ටර්ස් (මුද්‍රණය), 1990. - පි. 14 :
චිත්‍ර : සෙමී 17 × 11.
කබැ-බෝක : මිළ නොදැක්වේ. වයස අවු.8-10.
ISBN 955-28-0004-8


ස්වර්ණ හංස ජාතකය ඇසුරින් ලියැවුණු කෙටි කථාවකි.

9. අමරසේකර, රූපා




වක්කලමේ නිධානය / රූපා අමරසේකර විසිනි.– කැලණිය (305, ලියෝ මාවත, සිංහාරමුල්ල): ශීලා ප්‍රින්ටින් වර්ක්ස් (මුද්‍රණය), 1990.-පි. 24:
චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝක : රු. 35.00. වයස අවු. 8-12.
ISBN 955-95003-1-7

කුඩා දරුවකු මැණික් ගලක් ඇහිඳීම නිසා පවුලේ අය මුහුණ දුන් ප්‍රශ්නත් අන්තිමේ දී වාසනාව පැදුණු අයුරුත් කියැවෙන කථාවකි.



10. අමරසේන, කොළොන්නේ ලොකුලියන
    එළි මාමා / කොළොන්නේ ලොකුලියන අමරසේන විසිනි. - රත්මලාන (41, ලුම්බිණි මාවත): සර්වෝදය ග්‍රන්ථ ප්‍රකාශන සේවා, 1989.- පි. (11) , 58 : සෙමී 18.
    කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු. 8-12.
    ISBN 955-599-014-

    විශාල ශරීරයක් ඇති, ගොඩාක් කෑම කන අලස පුද්ගලයකු සිය කපටි කමින් ජීවිතය ගෙන යන ආකාරය වස්තු බීජය වී ඇති කථාවක් මේ ග්‍රන්ථයේ අඩංගුය.



11. අරංගල, රත්නසිරි
    කම්මැලි ජුවන්ගෙ කම්මල / රත්නසිරි අරංගල විසිනි. - කොළඹ 10 (675, පී. ද ඇස්. කුලරත්න මාවත) : ඇස්. ගොඩගේ, 1988. - පි. 17 : චිත්‍ර : සෙමී 24 × 17.
    කබැ-බෝක : මිළ නොදැක්වේ. වයස අවු.5-6.
    ISBN 955-20-0258-3

    කම්මැලියෙකු වූ ජුවන් කම්මලක් අරඹන සැටි ද, ඔහුට සපයන ලද යකඩ කැල්ලෙන් කිසිම දෙයක් සෑදීමට ඔහුට නොහැකි වූ සැටිද, කියැවෙන මෙම කථාව උස්බෙකිස්තානු ජන කථාවක් ආශ්‍රයෙන් ලියන ලද්දකි.



12. අලගියවත්ත, ජයලතා
    අත්තම්මගේ පාට කුඩේ / ජයලතා අලගියවත්ත විසිනි. - කොළඹ 05: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, 1989.- පි. (16) : චිත්‍ර : සෙමී 24.
    කබැ-බෝක: රු. 15.00. වයස අවු. 8-12.
    ISBN 955-610-002-4

    ඩුබායි රටෙන් අත්තම්මාට ලැබුණු පාට කුඩය රිළා පැටවකු විසින් ගෙන යනු ලැබූ අන්දමත්, එය නැවත ලබා ගත් අන්දමත් කියැවෙන ගීත නාටකයකි.




13. ආරියදාස, අපරාජිතා

කළු කුරුල්ලා / අපරාජිතා ආරියදාස විසිනි.- කොළඹ 05 (පාතලුව, පාදුක්ක) : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, 1990.- පි. (24): චිත්‍ර : සෙමී 24.
කබැ-බෝක: රු. 20.00. වයස අවු. 8-10.
ISBN 955-610-009-1


වළි කුකුළන් අතර හැදී වැඩුණු හංසයකු වළි කුකුළන් විසින් කොන් කරනු ලැබූ සැටිත්, කරදර ඉවසා ගත නොහැකිව පිට මං වූ හංසයාට උදව්වට ගිය බල්ලකු නිසා හංසයාගේ නියම තත්වය වළි කුකුළන්ට අවබෝධ වී හංසයා ඔවුන්ගේ නායකයා කර ගත් සැටිත් කියැවේ. දොළොස් හැවිරිදි දැරියකගේ නිර්මාණයකි.



14. ආරියදාස, එච්.

සුමිතුරෝ / එච්. ආරියදාස විසිනි. - කොළඹ 10 (101, ඇස්. මහින්ද මාවත, මරදාන): දයාවංශ ජයකොඩි, 1989.- පි. 88: සෙමී 20 × 12.
කබැ-බෝක : රු. 40.00. වයස අවු. 16-18.


සුමිතුරෝ, අහස් මාළිගා, වසවර්ති, නොමළ මිනිස්සු, අමනුස්සයෝ, වඳින්න ගිය දේවාලය යන කෙටි කථා හතෙහි එකතුවකි.



15. ආරියදාස, ටී. ඇම්.

ඩිංගිරි බංඩේගේ කතාව / ටී. ඇම්. ආරියදාස විසිනි.- ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය, 1990.- පි.11 : චිත්‍ර: සෙමී 20 × 13.
කබැ-බෝක : මිළ නොදැක්වේ.
වයස අවු. 8-10.

කැලෑ කැපීමේ හා විෂ මත් ද්‍රව්‍ය පාවිච්චියේ ආදීනව ද මව් පිය උපස්ථානයේ වැදගත්කමද අළලා ලියැවුණු කෙටි කතා තුනක එකතුවකි.




16. ආරියදාස, මධුභාෂණ


සත්ව විමානය / මධුභාෂණ ආරියදාස විසිනි.– පන්නිපිටිය (19, මාබුල්ගොඩ) : ජී. ඩබ්. (වංශනාථ) ආරියදාස, 1990.- පි. (4) : චිත්‍ර: සෙමී 25.

කබැ-බෝක: මිළ නොදැක්වේ.

වයස අවු. 8 -10.

ISBN 955-95265-0-2

පරිසරයද රැක ගනිමින් අවට කිසිවකුට හිරිහැරයක් නොවන ආකාරයෙන් ජීවත් විය හැකි අන්දම විදහා පාන ළමා කථාවකි.




17. ආරියදාස, මාලිනී ජී.

පිටාරය / මාලිනී ජී. ආරියදාස විසිනි. - පන්නිපිටිය (පරණ පාර): මනුලා මුද්‍රණාලය, 1990. - පි. 20 : සෙමී 21 × 13.

කබැ-බෝක: මිළ නොදැක්වේ.

වයස අවු. 14-16.

ISBN 955-95264-0-5

විවිධ මාතෘකා යටතේ ලියැවුණු කවි පන්ති එකතුවකින් මේ පොත නිමැ වී තිබේ.



18. ඉලංගරත්න, ටී. බී.

අයියලා නංගිලා / ටී. බී. ඉලංගරත්න විසිනි.– කොළඹ 10 (675, මරදාන පාර) : එස්. ගොඩගේ, 1989. - පි. 88: සෙමී 18.

කබැ-බෝක: මිළ නොදැක්වේ.

වයස අවු. 14-16.

ISBN 955-20-0142-0

කුඩා කල සිට එකට හැදී වැඩී පසුව වෛද්‍ය වෘත්තියට පිවිසි සිංහල සහ ද්‍රවිඩ සහෝදර සහෝදරියන් ජාති භේද අමතක කොට විවාහ වූ ආකාරය කියැවෙන කථාවකි.




19. ඉලංගරත්න, ටී. බී.
ශිෂ්‍යත්වය / ටී. බී. ඉලංගරත්න විසිනි. - කොළඹ 2 (ප්‍රකාශන අංශය, 41, ඩබ්ලියු. ඒ. ඩී.රාමනායක මාවත): ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, 1989. - පි.114: සෙමී 18.
කබැ-බෝක: මිළ නොදැක්වේ.
වයස අවු. 12-16.
ISBN 955-552-049-6

අඹ යහළුවෝ කථාවේ අනු ප්‍රබන්ධයකි. ළමා පරිවාසපති ගේ උදව්වෙන් ස්වයං රැකියාවකුත් කරමින් අධ්‍යාපනයක් ලබන තිමල් ක්‍රමයෙන් දියුණු වූ සැටිත්, නෙලුම් වලව්වේ උගස් කරන ලද ඉඩම් තිමල්ගේ නමට බේරා ගත් සැටිත්, සියල්ල සතුටින් කෙළවර වූ සැටිත් කියැවෙන කථාවක් මේ ග්‍රන්ථයට මුල් වෙයි.




20. උදයප්‍රිය, අතුල
නිලුපුලීගේ වාසනාව / අතුල උදයප්‍රිය විසිනි. – පන්නිපිටිය (1499 ඒ, විද්‍යාල හන්දිය): රංග ප්‍රකාශන, 989.- පි. 12 : චිත්‍ර : සෙමී 24 × 17.
කබැ.-බෝක : රු. 12.50. වයස අවු. 8-10.

උදාහි නමැති දැරියක සහ නිල් මහනෙල් මලක් අතර සංවාදයක් මෙම පොතේ තේමාව වී ඇත.




21. එදිරිසිංහ, කේ. ඩී. එස්.
කුකුළු පැංචාගේ වාසනාව / කේ. ඩී. එස්. එදිරිසිංහ විසිනි. - දෙල්ගොඩ : නිව් සෙන්ට්‍රල් මුද්‍රණාලය (මුද්‍රණය) , (1989?) . - පි. 06 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු. 6-8.
අ. වි. 372. 412 -

කුකුළු පැංචා අවලස්සන නිසා උගේ යහළුවන් ඌ එලවා දැමූ සැටිත්, උගේ කරුණාවන්තකම දෙවියන් ගෙන් තිසා, ලස්සණ රූපයක් ලැබුණු සැටිත් කියැවෙන කථාවකි.



22. එල්ලාවල, සුරංගනී
ටිකිරි සහ පඹයා / සුරංගනී එල්ලාවල විසිනි.– කොළඹ 11, (217, ඕල්කොට් මාවත): ඇම්. ඩී. ගුණසේන, 1990. –පි. 14: චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝක : රු. 24.50. වයස අවු. 6-8.
ISBN 955-21-0481-5

පඹයකු දැක බිය වූ දැරියක පිළිබඳ කෙටි කථාවකි.




23. ඒකනායක,. ඇකිරියගල එච්. ඒ.
තාත්තා එනතුරු / ඇකිරියගල එච්. ඒ. ඒකනායක විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1990. - පි. 63 : චිත්‍ර : සෙමී 20 × 13.
කබැ-බෝක : රු. 35.00. වයස අවු. 10-12.
ISBN 955-20-0310-5

පිටරට ගිය තම පියා ආපසු එනතුරු මඟ බලමින් සිටි පුතකුගේ දවස ගෙවී ගිය අයුරු දැක්වෙන කථාවකි.




24. ඒකනායක, ජේ. ඇස්. ඇම්.
ලේ කැටියෝ / ජේ. ඇස්. ඇම්. ඒකනායක විසිනි. – කොළඹ 11: ඇම්. ඩී. ගුණසේන, 1989. -පි. 13 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක: රු. 20.00. වයස අවු. 6-8.
ISBN 955-21-0048-8


යහපත් පුද්ගලයෙකු දැකීමෙන් වුවද යහ මගට යා හැකි බව විදහා පාන කථාවකි. බාලාංශ පංති සඳහා අතිරේක කියවීම් පොතකි.



25. ඒකනායක, බෝනා

ළමා සුරංගනී / බෝනා ඒකනායක විසිනි.- කොළඹ 11 (නො. 217, ඕල්කට් මාවත) : ඇම්. ඩී. ගුණසේන, 1989. - පි . 16 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක : රු. 29.50. වයස අවු. 6-8.
ISBN 955-21-0245-6

කුඩා සුරංගනාව, හේමා හාවාගේ පැනම යන සුරංගනා කථා දෙක මේ ග්‍රන්ථයේ දැක්වේ.




26. මන්න බබෝ / සම්පාදනය සිරිසේන කුලතිලක විසිනි.– කොළඹ 11: ඇම්. ඩී. ගුණසේන, 1989.- පි. 9 : චිත්‍ර : සෙ.මී. 24.
කබැ-බෝක: රු. 16.50. වයස අවු. 8-10.
ISBN 955-21-0250-2


ජනප්‍රිය දරු නැළවිලි ගී කීපයක් මෙම ග්‍රන්ථයෙහි අඩංගු වේ.




27. මස්ටින්, ඇම්. ඩී. ඇන්.

මහා විද්‍යාඥයෝ / ඇම්. ඩී. ඇන්. මස්ටින් විසිනි. –කොළඹ 11 (217, ඕල්කොට් මාවත): ඇම්. ඩී. ගුණසේන, 1989. මුල් පොත. - පි. 31 : චිත්‍ර : සෙමී 22.
කබැ-බෝක: රු. 21.50. වයස අවු. 12-16.
ISBN 955-21-0436-×


ආකිමිඩීස්, ගැලීලියෝ, නිව්ටන් සහ එඩිසන් යන විද්‍යාඥයන් වටා මේ පොත ලියැවී ඇත.



28. ඕවිටිගල, පැරකුම්

පෙරළිය / පැරකුම් ඕවිටිගල විසිනි. - කොළඹ 10 (අංක 1, කේ. ඩී. ඩේවිඩ් මාවත): ග්ලොබ් ප්‍රින්ටින් වර්ක්ස් (මුද්‍රණය), 1989.- පි. (XIII) , 53 : සෙමී 21.
කබැ-බෝක: මිළ නොදැක්වේ.
වයස අවු. 12-16

පෙරළිය, ලොකු හාමුදුරුවෝ දෙසුම ලොකු මහත්තයා සහ අම්මා යන කෙටි කථා පහ ඇතුළත් ග්‍රන්ථයකි.



29. ක්ලේවල්, ජේම්ස්

විනෝදී විසිපහ / ජේම්ස් ක්ලේවල් විසිනි: පරිවර්තනය සේනාරත්න වීරසිංහ විසිනි. - වේයන්ගොඩ (නො. 174 / 28, රණසිංහ මාවත) : ප්‍රභා ප්‍රකාශකයෝ, 1989.-
පි. 44 : සෙමී 19.
කබැ-බෝක: රු. 20.00. වයස අවු. 10-12.
ISBN 955-9001-10-8

තරුණ ගුරුවරියක් තම පන්තියේ දඟකාර දරුවන් තමාට අවශ්‍ය ලෙස හික්මවා ගත් අයුරු කියැවෙන මේ පොත ඉංග්‍රීසි ග්‍රන්ථයක පරිවර්තනයකි.




30. කරුණාතිලක, ඇන්. ටී.

වවුලාගේ මඟුල් ගෙදර සහ තවත් කතා / ඇන්. ටී. කරුණාතිලක විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) : එස්. ගොඩගේ, 1989.-
පි. 31 : චිත්‍ර : සෙමී 22.
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු. 6-8.

වවුලාගේ මඟුල් ගෙදර අපූරු යාළුවෝ බූරුවා රජ වෙලා යන ළමා කථා තුන ඇතුලත් ග්‍රන්ථයකි.




31. කරුණාරත්න, විජය
කැකුලක මහිම / විජය කරුණාරත්න විසිනි.– කොළඹ (තැ. පෙ. 1946) : කොළඹ පොත් සංගමය, 1989. - පි. 12 : චිත්‍ර : සෙමී 24.
3-4 වසර සිසුන් සඳහා.
කබැ-බෝර්ක: මිළ නොදැක්වේ.
වයස අවු. 8-10.

වෙස් වළාගෙන සිය රාජ්‍යයේ ඇවිදිමින් සිටි රජ කෙනෙකුට නිර්භීත, හොඳ දරුවකු හමු වූ සැටිත්, අවසානයේ එම දරුවා රජුගේ දරු තනතුර ලැබූ හැටිත් කියැවෙන කථාවක් මේ ග්‍රන්ථයෙහි ඇතුළත් වේ.




32. කරුණාරත්න, සිරිල්
හා පවුලේ කතාව / සිරිල් කරුණාරත්න විසිනි. - දෙහිවල (27, පැපිලියාන පාර): ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්, 1988. - පි. 18 : චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝර්ක : මිළ නොදැක්වේ.
වයස අවු. 6-8.

ප්‍රංශ ළමා කතාවක් ආශ්‍රයෙන් ලියන ලද්දකි. ගොවිපළකින් කැරට් සොරා ගැනීමට ගිය හා පැටවකු අයිතිකාරියට අසු වූ සැටිත්, උගේ යහළු සතුන් එකතු වී හා පැටියා බේරා ගත් සැටිත් කියැවෙන කථාවකි.




33. කල්දේරා, ශ්‍රී ලාල්
පරම යුතුකම / ශ්‍රී ලාල් කල්දේරා විසිනි. - කොළඹ 10 (3, කේ. ඩී. ඩේවිඩ් මාවත) : කැප්ටන් මුද්‍රණාලය, 1988.- පි. 10 : චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝර්ක : රු. 15.00. වයස අවු. 6-8.
ISBN 955-9048-02-3

එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශයක් වන 'මිනිසාගේ පරමයුතුකම මිනිසාට සේවය කිරීමයි' යන්න ආශ්‍රයෙන් ලියැවුණ ග්‍රන්ථයකි.



34. කලහේ, කීර්ති

නෙළුම් කුමාරි / කීර්ති කලහේ විසිනි.–කොළඹ 11 (නො. 217, ඕල්කොට් මාවත): ඇම්. ඩී. ගුණසේන, 1989.- පි. 18 : චිත්‍ර : සෙ.මී. 25.
කබැ-බෝක: රු. 28.50. වයස අවු. 8-10.
ISBN 955-21-0118-2


නුග ගසක් මුල තපස් රකිමින් උන් තාපසයකුට මහා වැසි දිනක නෙළුම් මලක උපන් සිහිති දැරියක හමු වූ කථාව මේ ග්‍රන්ථයෙහි කියැවේ.

35. කහටපිටිය, ලක්ෂ්මන්



එන්න මගේ යාළුවේ / ලක්ෂ්මන් කහටපිටිය විසිනි. - නුගේගොඩ (35, නාවල පාර) : දිසානන්ද මුද්‍රණාලය, 1988.- පි. 32 : චිත්‍ර : සෙමී 20 × 13.
කබැ-බෝක : රු. 20.00. වයස අවු. 6-8.
ISBN 955-603-002-5

පෙම්බර ලංකා, අපි නිදියෝ, ඩකස් බකස්, එකමුතු, කොහෙද යන්නෙ ගංගා, සඳ පායාවි, නංගි බබා, සමනළයෝ කොහෙද යන්නෙ?, පාට පාට මල් පිපිලා, එන්න මගේ යාළුවේ, සිරිපා නමාමි, කැලැන්ඩරේ, අත්වැඩ පාඩම ඇවිදින් සහ අම්ම මගේ රත්තරං යන කවි පෙළ වලින් යුක්තයි.



36. කිරිඇල්ල, සෝමා

සෙල්ලම් හෝඩිය / සෝමා කිරිඇල්ල විසිනි.- දෙහිවල (නැදිමාල): ශ්‍රී දේවි ප්‍රින්ටර්ස් (මුද්‍රණය), 1990. - පි. 30 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක: රු. 30.00. වයස අවු. 4-5.

සිංහල හෝඩියේ අකුරු අඳුනා ගැනීමට සුදුසු අභ්‍යාස වලින් මේ පොත නිමැවී තිබේ.




37. කිරිවත්තුඩුව, ස්වර්ණලතා

ඉහට වහළක් / ස්වර්ණලතා, කිරිවත්තුඩුව විසිනි. - කොළඹ 11 (217, ඕල්කොට් මාවත): ඇම්. ඩී. ගුණසේන,1989. -පි.(vi) 94: සෙමී 18. කබැ-බෝර්ක: රු. 38.50. වයස අවු. 14-16.
ISBN 955-21-0425-4

සිය පවුලේ අභ හිතකම් නිසාම නරක ඇසුරට වැටෙන දරුවකු, සිය යහළුවන්ට සිදු වන කරදර නිසාත්, ප්‍රශ්න අවබෝධ කර ගැනීම නිසාත් නැවතත් සුමගට වැටෙන අයුරු කියැවෙන කථාවක් මේ පොතින් දැක්වේ.




38. කුඩලිගම, ආචාර්ය පී.

ඒක තමයි අපෙත් සතුට / ආචාර්ය පී.කුඩලිගම විසිනි.- කොළඹ 10 (අංක 675, මරදාන පාර): ඇස්. ගොඩගේ, 1990. - පී. 23 : චිත්‍ර : සෙමී 20 × 13.
කබැ-බෝර්ක: මිළ නොදැක්වේ. වයස අවු.6-8.


නීලාගේ වාසනාව, සමන්ගේ සිහිනය, ඒක තමයි අපෙත් සතුට, මංජුගේ කෝච්චිය යන කෙටි කතා හතර ඇතුළත්ය.




39. කුමාරදාස, කලහෙ

මී අඹවල පැණි පිරිලා / කලහෙ කුමාරදාස විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1990. - පි. 16: චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝර්ක: මිළ නොදැක්වේ. වයස අවු.6-10.
ISBN 955-20-0402-0

ළමා මනසට සමීප මාතෘකා මත ලියැවුණු ගී වැල් එකතුවකි.



40. කුමාරසිංහ, කුලතිලක

හේමපාල මුනිදාසගේ කෙටිකතා / කුලතිලක කුමාරසිංහ විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර): ඇස්. ගොඩගේ, 1988.-පි. 130: සෙමී 21.
නුබැ-බෝක: මිළ නොදැක්වේ.
වයස අවු. 15-18.
ISBN 955-20-0156-2

හේමපාල මුණිදාසයන්ගේ කෙටි කථා පිළිබඳ සවිස්තරාත්මක විවේචනයක් ද ඔහුගේ හේවායා අහුටු මිට්ටා, හිරකාරයා, සියුම් පළිගැනීමක් යන කෙටි කථා ද මෙහි ඇතුළත් ය.



41. කුමාරි, කරුණා

පුංචි කිකිළි / කරුණා කුමාරි විසිනි. - කොළඹ 11 (217,ඔල්කොට් මාවත): ඇම්. ඩී. ගුණසේන, 1989.- පි. 16: චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක: රු. 23.50. වයස අවු. 6-8.
ISBN 955-21-0178-6


තනිවම වී වපුරා, ගොයම් කපා, පාගා වී ලබාගෙන කැවුම් උයා ගත් කිකිළි කැවුම් රැගෙන යද්දී කපුටෝ කැවුම් සොරා ගත්හ. මේ කථාව පදනම් කර ලියැවුනකි.




42. කුමාරි, කරුණා

මාල ගිරවා / කරුණා කුමාරි විසිනි.- කොළඹ 11 (ඔල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන, 1990. - පි. 14: චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝක : රු. 22.50. වයස අවු. 5-6.

ලේනකුගේ අතින් ගිලිහුණු අඹ ගෙඩියක හඬට අසල වූ සතුන් බිය වූ සැටිත්, ඒ නිසාම ළමයකුට ගිරා පැටියෙකු ලැබුණු සැටිත් කියැවෙන කථාවකි.





43. කුලරත්න. කේ. ඒ.

ළමා මීර / කේ. ඒ. කුලරත්න විසිනි. - මීගමුව සංඛ මුද්‍රණ, 1989. - පි. 62: සෙමී 21.
කබැ-කක: රු. 50.00. වයස අවු-6-10.

ළමා ගීත ගණනාවක් ද ඒවායේ ස්වර ප්‍රස්තාර ද සහිත ග්‍රන්ථයකි.

44. කුලරත්න, සුනිල්

දුටු ගැමුණු චරිතයේ ඇති මිනිස්කම / සුනිල් කුලරත්න විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර):ඇස්. ගොඩගේ, 1988. - පි. 34; සෙමී 18.
කබැ-බෝක:මිළ නොදැක්වේ. වයස අවු. 8-10.
ISBN 955-20-0160-9



දුටුගැමුණු චරිතයෙන් පෙනෙන ජාතික කැක්කුම,දෙගුරුන්ට අවනත වීම, අවස්ථාව අනුව ජීවිතය හැඩ ගස්වා ගැනීම බාලයන්ගේ වරද ඉවසීම, දුර දිග බලා කටයුතු කිරීම, අනුන් ලවා අඩමාන දේ නො කරවා ගැනීම, පිදිය යුත්තන් පිදීම හා වරද වරද ලෙස පිළිගැනීම යන උතුම් ලක්‍ෂණ අළලා ලියන ලද ග්‍රන්ථයකි.

45. කේයස්

සුදෝ සුදු / කේයස් විසිනි. - කොළඹ 10 (596/1, මරදාන පාර) : ඩී. කේ. ඩබ්ලිව්. සිරිවර්ධන පොත් හල, 1990. - පි. 28 : සෙමී 17 × 11.
කබැ-බෝක : මිළ නොදැක්වේ.
වයස අවු. 12-14.




කුඩා කල සිට එකට වැඩුණු දරු දැරියන් තිදෙනෙකු විය පත්ව විවිධ අත්දැකීම්වලට මුහුණ පෑ අන්දම කියැවෙන කවි පොතකි.




පරදුව රූපා කොඩිතුවක්කු

46. කොඩිතුවක්කු, පරදුව රූපා

වැහි කුමාරි / පරදුව රූපා කොඩිතුවක්කු විසිනි. - කොළඹ 11 (නො 217, ඕල්කොට් මාවත): ඇම්. ඩී. ගුණසේන, 1989. - පි. 12: චිත්‍ර : සෙමී 24.
කබැ-බෝක: රු. 22.50. වයස අවු 8-10.
ISBN 955-21-0351-7

ලස්සන ඇඳුම් ගැන ආඩම්බර වීමට වඩා වැදගත් වන්නේ තමාගෙන් අනුන්ට වන යහපත පිළිබඳව බව තේරුම් ගන්නා හිම කුමාරිගේ කථාව මේ පොතින් කියැවේ.



සෙනරත් ගොන්සල් කෝරාළ


47. කෝරාළ, සෙනරත් ගොන්සල්

කුරුලු ගී / සෙනරත් ගොන්සල් කෝරාළ විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1990. - පි.16 : චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.6-10.
ISBN 955-20-0376-8

ළමා මනසට සමීප මාතෘකා කීපයක් මත ලියැවුණු කවි එකතුවකි.

48. ගමලත්, සුචරිත

ළමා රාමායණය / සුචරිත ගමලත් විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1989.- පි. 49:චිත්‍ර : සෙමී 21.
මැබැ-බෝක:මිළ නොදැක්වේ.
වයස අවු.14-16.
ISBN 955-20-0285-0



රාමායණය කතාව වාල්මීකී විසින් ලියන ලද හැටිත්, ලංකා පුරයේ රාවණ පැහැරගෙන ආ සීතා රාමා විසින් ගලවා ගන්නා ලද අන්දමක් මෙම පොතෙහි කියැවේ. රාමායණ මහා කාව්‍යය අනුව ලියා තිබේ.



49. ගමගේ, ගැමුණු සිරි

ටැලිෆෝන් ගැටේ / ගැමුණු සිරි ගමගේ විසිනි. - පන්නිපිටිය (1499 / ඒ, විද්‍යාල හන්දිය) : රංග ප්‍රකාශන, 1989. - පි. 16 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක: රු. 12.50. වයස අවු. 6-8.
අ. වි. ළ891.483-

දරුවන් සෙල්ලම් ටෙලිෆෝනයක් සෑදූ සැටිත්, එහි නූල ගැට ගැසුනු නිසා ගැට ලිහීමට ගත් වෙහෙසත් කියැවෙන කථාන්තරයක් මේ ග්‍රන්ථයේ කියැවේ.



50. ගමගේ, ගැමුණු සිරි

මොනර හාමිගෙ කවි පාඩම / ගැමුණු සිරි ගමගේ විසිනි. - පන්නිපිටිය(1499/ඒ, විද්‍යාල හන්දිය, හෝකන්දර): රංග ප්‍රකාශන, 1989.- පි. 12 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක: රු. 12.50. වයස අවු. 5-6.

මොනරා,රිලවා, සැලලිහිණියා සහ දෙමලිච්චිට කවියක් කියා දෙයි. දැහැලීම නිසා දෙමලිච්චිට කවිය පාඩම් නොවේ. දැහැලිල්ල අඩු වී කීකරු වූ පසුයි ඇයට කවිය පාඩම් වුනේ. මෙම කථාව පදනම් කරගෙන, මොනරහාමිගෙ කවි පාඩම, පොත නිර්මාණය වී ඇත.



51. ගමගේ, ලතා

අලි පැටියට වෙච්චදේ / ලතා ගමගේ විසිනි.- කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1990.-පි.(7) : චිත්‍ර: සෙමී 24 × 17.
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු. 6-8.
ISBN 955-20-0414-4

මවගේ අවවාද නොඇසූ අලි පැටියකුට වුදේ ගීයෙන් දැක්වේ.

52. ගමගේ, සිරිල්




වරුණ / සිරිල් ගමගේ විසිනි. - කොළඹ 10 (53, මාලිගාකන්ද පාර, මරදාන) : සමයවර්ධන (මුද්‍රණය), 1989. - පි. 32: සෙමී 21.
කබ-බෝක: මිළ ංනොදැක්වේ.
වයස අවු 10-12.

තම වාසියටත්, විනෝදයටත් බොරු කීම පුරුද්දක් කරගෙන සිටි දරුවකුගේ බොරු එළිවීමෙන් ඔහු මුහුණ පෑ තත්වයත්, ඔහු යහපත් දරුවකු වූ ආකාරයත් කියැවෙන කථාවකි.


53. ගුණතිලක, ටිකිරිබණ්ඩාර




සමන්මලී / ටිකිරිබණ්ඩාර ගුණතිලක විසිනි. - හෙම්මාතගම (අරනායක පාර) : ලක්මිණි මුද්‍රණාලය (මුද්‍රණය), 1989.-පි. 16: සෙමී 24.
කබ-බෝක: රු. 10.00. වයස අවු. 8-10.
ISBN 955-95222-0-5

කුඩා දැරියක් සිය මිත්තණිය සමඟ කුරුළු කූඩුවක් කඩා වැටෙන්නට නොදී බේරා ගත් ආකාරය කියැවෙන කථාවක් මේ පොතෙන් කියැවේ.

54. ගුණතිලක, මදුරසිංහ




පබඳ හුරුව / මදුරසිංහ ගුණතිලක විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1989. - පි 82 : සෙමී 21.
(ළමා පර්යේෂණ ග්‍රන්ථ : 5).
කබ-බෝක: මිළ නොදැක්වේ.
වයස අවු.13-16.
ISBN 955-20-0242-7

නිවැරදිව සිංහලෙන් රචනා ලිවීමේ ශක්තියක්, නිවැරදි ව්‍යාකරණ භාවිතය සහ රස විඳීමේ හැකියාව දියුණු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද රචනා සහ අභ්‍යාස ඇතුලත් ග්‍රන්ථයකි.

55. ගුණරත්න, ආනන්ද




කෝන්තරය / ආනන්ද ගුණරත්න විසිනි. - කොළඹ 11 (217, මල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන, 1990. - පි. 18: චිත්‍ර: සෙමී 24. කබැ-බෝක: රු. 29.50. වයස අවු 6-8.

ISBN 955-21-0397-5

නයාට වැලඳී තිබුණු රෝගයක් උගේ සතුරා වූ මුගටියා විසින් අඳු කොල පොවා සනීප කරවන ලදී. නයි දළවල විස රැඳුනේත්, නයාට අඳු කොළ අප්‍රසන්න වුනේත් ඉන් පසුවයි.

56. ගුණවර්ධන, බී. අබේසිරි




කිඹුල්හාමිගෙ දත් කැක්කුම / බී. අබේසිරි ගුණවර්ධන විසිනි. - කොළඹ 10: ඇස්. ගොඩගේ, (1989?). - පි. 8: චිත්‍ර: සෙමී 24. කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු 6-8.

ISBN 955-20-0212-9

කිඹුල්හාමි නරක් වූ දත් ගැළවීම සඳහා වෛද්‍යවරයෙකු ළඟට ගියවිට ඔහු කිඹුලගේ කට තුළට බැස දත් ගළවන්නට විය. මේ අතර හොඳ දතක්ද ගැළවුණි. එහිදී ඇති වූ වේදනාව නිසා කිඹුලගෙ කට ඉබේම වැසුනේය. වෛද්‍යවරයා උගේ කුසට වැටුණි.

57. ගුණවර්ධන, පී. එස්. ඩබ්ලිව්.



එම්බා කවුඩුවනේ / පී. එස්. ඩබ්ලිව්. ගුණවර්ධන විසිනි. - කොළඹ 1 (සහ පානළුව, පාදුක්ක): රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, 1990. - පි. 82: සෙමී 17 × 13. කබැ-බෝක : රු. 27.50. වයස අවු. 10-14.

ISBN 955-610-049-0

නොතිවෙන ගිත්න අසරණ කපුටා සහ ගොරහැඩි වඳුරුමාල්ලා, කේජු කැල්ලෙන් වූ හදිය, රාජ භෝජනය, පරපුටු වෘතාන්තය, කපුටු සාස්තරය යන කෙටි කථාවල එකතුවකි.

58. ගුණවර්ධන. පී. එස්. ඩබ්ලිව්.




දරු සෙනෙහස / පී. එස්. ඩබ්ලිව්. ගුණවර්ධන විසිනි. - පිළියන්දල (ප්‍රබුද්ධ මාවත, මාම්පේ): විශ්වකලා මුද්‍රණාලය (මුද්‍රණය), 1989. - පි. 80, සෙමී 20.
කබැ-බෝක: රු. 30.00. වයස අවු. 10-14.
ISBN 955-95034-1-3

වැලහින්තියක සිය පැටවා මිනිසුන් විසින් අල්වාගත් පසු මිනිස් දරුවකු සොරාගෙන ගොස් ආදරය දක්වන පුවතක් මෙහි කියැවේ. අවසානයේ නැවත වැලහින්නට සිය පැටවා හමුවේ. මිනිසුන් මෙන්ම තිරිසන් සතුන් තුළද පවතින උදාර දරු සෙනෙහස කියාපාන කෘතියකි.

59. ගුණසිංහ, පාලිත




සුවඳැති මලක් / පාලිත ගුණසිංහ විසිනි. - කොළඹ 12 (33, පියරි සයිබු වීදිය) : පයනියර් ඕෆ්සෙට් ප්‍රින්ටර්ස්, 1990.-පි. 8 : චිත්‍ර: සෙමී 24 × 19.
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.6-8.

රණසිංහ ප්‍රේමදාසයන්ගේ ළමා කාලය අළලා ලියැවුණකි.

60 ගුණසේකර, කේ. ඩී. සී.



පරිසරය 4 වසර: 1989 නව විෂය නිර්දේශයට අනුව / කේ. ඩී. සී. ගුණසේකර විසිනි. - රාජගිරිය (78, මොරගස්මුල්ල): චන්ද්‍රදාස හේවගේ, 1989. - පි.112: සෙමී 21.
කබැ-බෝක: රු. 30.00. වයස අවු. 9-11.
ISBN 955-9058-01-0

හතර වැනි වසරට නියමිත පරිසරය විෂයයට අදාලව මෙම ග්‍රන්ථය නිමවා තිබේ.



61. ගුණසේකර, ජෝ. රංජිත්

සුරංගනා ලොවින් ගෙනා ගී / ජෝ. රංජිත් ගුණසේකර විසිනි. - නුගේගොඩ (12/50, එදිරිසිංහ පාර, මිරිහාන): පූර්නදී ප්‍රකාශකයෝ, 1989. - පි. 12: චිත්‍ර: සෙමී 24.
කබැ-බෝක: රු. 25.00. වයස අවු. 10-12.

ළමා මනසට සමීප මාතෘකා කීපයක් වටා ලියැවුණ ගී පත්ති එකතුවකි.



62. ගුණසේකර, ප්‍රභාෂිණී

ගලක් පලා වතුර දුටින් / ප්‍රභාෂිණී ගුණසේකර විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1990.- පි. 12 :
චිත්‍ර : සෙමී 20 × 13.
කබැ-බෝක: මිළ නොදැක්වේ.
වයස අවු. 8-10.
ISBN 955-20-0352-0


උත්සාහයේ ප්‍රතිඵල දැක්වෙන ජාතක කථාවක් ඇසුරෙන් ලියැවුණ කෙටි කථාවකි.



63. ගුණසේකර, බන්දුසේන

කම්මැලියාට ලියුමක් / බන්දුසේන ගුණසේකර විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1990. පි. 16 :
චිත්‍ර : සෙමී 23 × 17.
කබැ-බෝක : මිළ නොදැක්වේ.
වයස අවු. 6-9.

ළමයින් අතර කම්මැලියන් නොවන බව කියැවෙන ගී පොතකි.



64. ගුණසේකර, බෝවල කේ. ඩී. සී.

පරිසරය 5 වසර / බෝවල කේ. ඩී. සී. ගුණසේකර විසිනි. - කැළණිය (305, ලියෝ මාවත, සිංහාරමුල්ල): ශීලා ප්‍රින්ටින් වර්ක්ස් (මුද්‍රණය), 1990.- පි. 136:
චිත්‍ර : සෙමී 21 × 14.
කබැ-බෝක : රු. 40.00. වයස අවු. 11-12.
ISBN 955-9058-02-9


5 වසර සඳහා නියමිත පරිසරය විෂයයට අදාල කරුණු විස්තර වශයෙන් ඉදිරිපත් කොට ඇත.



65. ගුණසේකර, සුභාෂිනී

අවුරුදු තෑග්ග / සුභාෂිනී ගුණසේකර විසිනි.- කොළඹ 10 : ඇස්. ගොඩගේ, [1989 ].-පි. 32:
චිත්‍ර : සෙමී 21.
කබැ-බෝක: මිළ නොදැක්වේ.
වයස අවු. 6-10.
ISBN 955-20-0271-0

දෙමාපියන් මිය ගිය කමලා සහ ඇගේ මල්ලි නිමල් ඉතා දුප්පත්ය. කමලා කුලී වැඩ කරමින් නිමල් පාසල් යැව්වාය. සිංහල අවුරුද්දට කමලා මල්ලිට මසා දුන් කමිසය රවි මඩේ ගැසුවේය. ඒ නිසා ඔහුගේ දෙමාපියෝ නිමල්ට ඇඳුම් කට්ටල තුනක් අවුරුදු තෑග්ගක් ලෙස දුන්නහ. ඒ නිසාම රවි නරක පුරුදු අත්හළේය.



66. ශ්‍රේරු, සී. ආනන්ද

සමනලයෝ / සී. ආනන්ද ශ්‍රේරු විසිනි. - වැල්ලම්පිටිය (142, අවිස්සාවේල්ල පාර): චතුර මුද්‍රණ ශිල්පියෝ, (මුද්‍රණය), 1990.- පි. 26 : චිත්‍ර : සෙමී 20 × 13.
කබැ-බෝක : මිළ නොදැක්වේ.
වයස අවු. 6-8.
ISBN 955-20-0413-6

කුඩා දරුවන්ගේ මනසට සමීප මාතෘකා කීපයක් මත ලියැවුණු කවි එකතුවකි.




67. චන්ද්‍රරත්න, රූපා

හඳට ගිය හාවා / රූපා චන්ද්‍රරත්න විසිනි. - කොළඹ 11: ඇම්. ඩී. ගුණසේන, 1989. - පි. [16] : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක : රු. 21.50. වයස අවු. 8-10.
ISBN 955-21-0235-9

බෝසත් හාවා තපස් රැක්ක සැටිත්, බඩගින්නේ තමා හමුවට පැමිණි බමුණකුට සිය මස් පලහා දීමට ගින්නට පැන්න සැටිත්, ප්‍රීතියට පත් ශක්‍රයා හාවාගේ රූපය හඳේ ඇන්ද සැටිත්, මෙම කථාවෙන් කියැවේ. සස ජාතකය ආශ්‍රයෙන් ලියන ලද්දකි.




68. චන්ද්‍රසේකර, ස්වර්ණා

එකෝමත් එක රටක විත්ති / ස්වර්ණා චන්ද්‍රසේකර විසිනි. - වැල්ලම්පිටිය (749, අවිස්සාවේල්ල පාර): ලස්සන මුද්‍රණ ශිල්පියෝ, 1990.- පි. 95 : චිත්‍ර : සෙමී 18 × 13.
කබැ-බෝක : රු. 40.00. වයස අවු. 10-14.

සිංහල ජනකථා ආශ්‍රයෙන් ලියැවුණ සුදු හාවාගේ වග, අමල් බිසෝ හමුවෙයි, රන් මිණි, කුකුළා මගනෙයි, දෙව්ලොව ගමන, විලෙන් ගොඩට යන කෙටි කථා එකතුවකි.



69. ජකාර්ද්, ඉසබෙල්

බුලී-පුංචි කළු බලු පැටියා / ඉසබෙල් ජකාර්ද් විසිනි: අනුවාදය මාලිනී ජයවර්ධන විසිනි. - (තැ. නො) : එක්සත් වෙළඳ සංගමය (මුද්‍රණය), 1989. - පි. 30: චිත්‍ර : සෙමී 21.
ඉසබෙල් ජකාර්ද්ගේ ප්‍රංශ ළමා කතාවක සිංහල අනුවාදයකි.
කබැ. - බෝක: රු. 19.50. වයස අවු. 5-6.

සබන් කැටයක් ගිලුණු බලු පැටියා බුරන හැම විටකම උගේ කටින් සබන් බෝල පිටවෙයි. එය දුටු සර්කස් කණ්ඩායමක් ඌ රැගෙන යයි. සබන් බෝල පිට වීම නැවතුණු පසු එලවා දමනු ලැබූ බලු පැටියා තම ස්වාමියා සොයා ගෙන යයි. මේ කථාව සහිත කෘතිය ප්‍රංශ කථාවක පරිවර්තනයකි.

70. ජයකොඩි, මර්සලින්

මව්ගුණය / මර්සලින් ජයකොඩි විසිනි. - වැල්ලම්පිටිය (දිවැස ප්‍රචාරකයෝ, 75, අවිස්සාවේල්ල පාර) : සෝමසිරි කස්තූරි ආරච්චි, 1989. - පි. 24 : චිත්‍ර : සෙමී 21. කබැ-බෝක: රු. 20.00. වයස අවු. 8-12.
ISBN 955-9039-04-0



සියළු මව්වරුන් සිය දරුවනට දක්වන සෙනෙහසත් දරුවන් සිය මව්වරුනට සෙනෙහස හා ගෞරවය දැක්විය යුතු ආකාරයත් මෙහි විස්තර කැරේ.

71. ජයකොඩි, සරත්චන්ද්‍ර

පිංකාලිය / සරත්චන්ද්‍ර ජයකොඩි විසිනි. - පිළියන්දල: 'ප්‍රිමියර් ප්‍රකාශකයෝ', [1990].-පි. 20 : සෙමී 25. කබැ-බෝක: රු. 18.50. වයස අවු. 8-12.
ISBN 955-9002-19-8



පැරණි සමාජයේ ජන ජීවිතයෙහි පැවැති චාරිත්‍ර වාරිත්‍ර හා ගුණධර්ම හුවා දක්වමින් පිංකාලිය, පිංපොත, පිංගොනා සහ පිං බෙහෙත් ශාලාව වශයෙන් කථා හතරක් ඇතුලත් කර ඇත.

72. ජයකොඩි, සෝමා

ළමා නැටුම් ගී / සෝමා ජයකොඩි විසිනි / චිත්‍ර සිබිල් වෙත්තසිංහ විසිනි. - වැල්ලම්පිටිය (183, ඒ. අවිස්සාවේල්ල පාර): ලස්සන මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ, 1989. - පි. 37 : චිත්‍ර : සෙමී 25. තුබැ-කාබෝක: රු. 25.00. වයස අවු. 10-14.
ISBN 955-550-029-0



නැටුමින් ඉදිරිපත් කළ හැකි ගී එකතුවක් ඇත.




73. ජයතිලක, කේ.

රුවන් කුමාරි / කේ. ජයතිලක විසිනි. - කොළඹ 12 (34/34, නීතිඥ කාර්යාල සංකීර්ණය): ප්‍රදීප ප්‍රකාශකයෝ, 1990. - පි. 16 :
චිත්‍ර : සෙමී 28.
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.8-10.

කුස ජාතකය ඇසුරෙනි. පබාවතිය සහ කුස කුමරුගේ කථාවේ ඇතැම් සිද්ධීන් වටා ගොතන ලද අළුත් සුරංගනා කථාවකි.




74. ජයතිලක, කේ.

වන සටන / කේ. ජයතිලක විසිනි. - කොළඹ 12 (නීතිඥ කාර්යාල සංකීර්ණය, 34/34, සන්ත බස්තියම කන්ද) :ප්‍රදීප ප්‍රකාශකයෝ, 1990. - පි. 74 : සෙමී 18.
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.8-14.

කැලෑ එළි කොට වගාකරන මිනිසුනට විරුද්ධව වන සතුන් සටන් කරන සැටිත්, අවසානයේ මිනිසුන් ජය ගන්නා සැටිත් කියැවෙන කථාවකි. ළමා නවකතාවකි.




75. ජයතිලක, සුමනා

යාළුවෝ / සුමනා ජයතිලක විසිනි. -වැල්ලම්පිටිය (749, අවිස්සාවේල්ල පාර) : ලස්සන මුද්‍රණ ශිල්පියෝ, 1990. - පි. 12 :
චිත්‍ර : සෙමී 24 × 17.
තුබැ-කාබෝක : රු. 30.00. වයස අවු. 6-8.
ISBN 955-550-037-1

සිදු වූ වැරදි අමතක කොට මිතුරුව සිටීම පිළිබඳව වැඩිහිටියන්ට ආදර්ශයක් වූ දැරියන් දෙදෙනෙකු පිළිබඳ කෙටි කථාවකි.




76. ජයරහල්, ව. රණවිරු

කුරුළු සබය / ව. රණවිරු ජයරහල් විසිනි. - කොළඹ 11 (217,ඔල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1989.-පි. (6)13: සෙමී 25.

කබැ-බෝක: රු. 20.00. වයස අවු. 8-10.

ISBN 955-21-0290-1

කුරුල්ලන්ට රජ කෙනකු තෝරා ගැනීමට සබාවක් පැවැත්වෙත් දී උන් කුරුළු වැද්දකුගේ දැළට අසු වී දෙහිවල සත්තු වත්තට ගෙන ගිය කථාවකි.



77. ජයවර්ධන, ආනන්ද

සිංහල අවුරුදු රබන් පද / ආනන්ද ජයවර්ධන විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) ඇස්. ගොඩගේ, 1990. - පි. 6 : චිත්‍ර : සෙමී 24 × 17.

කබැ-බෝක : මිළ නොදැක්වේ.

වයස අවු. 8-12.

රබන් පද එකතුවකි.



78. ජයවර්ධන, ඩබ්ලියු.

ආදර්ශ රචනා / ඩබ්ලියු. ජයවර්ධන විසිනි. - කෑගල්ල (හෙට්ටිමුල්ල) : කොලිටි ප්‍රින්ටර්ස්, 1990. - පි. –72 : සෙමී 20 × 13.

කබැ-බෝක : මිල නොදැක්වේ.

වයස අවු. 10 –12.


පස්වැනි වසරේ සිසුනට ආදර්ශ ලෙස ගත හැකි රචනා එකතුවකි.




79. ජයවර්ධන, ඩබ්ලියු.

ගහකොළ මව්වරු පියවරු වැන්නෝ / ඩබ්ලියු ජයවර්ධන විසිනි. - කෑගල්ල (මාකර, හෙට්ටි මුල්ල): කොළිටි ප්‍රින්ටර්ස් (මුද්‍රණය) 1990. පි. 18 : චිත්‍ර : සෙමී 19. කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.8-10.
ISBN 955-95191-2-3

ගසක වටිනාකම කියා දෙන අතර 'ගසක් කපන්නට පෙර ගස් දෙකක් සිටුවන්න' යන අවවාදය ද ඉදිරිපත් කරන ග්‍රන්ථයකි. මෙය විවෘත අත් පිටපත් තරඟයෙන් ජයගත් කථාවකි.




80. ජයවර්ධන, ඩබ්ලියු.

තුට්ටු දෙකේ ලෝබයෙක් / ඩබ්ලියු. ජයවර්ධන විසිනි. - කෑගල්ල (හෙට්ටිමුල්ල) : කොළිටි ප්‍රින්ටර්ස් 1990. - පි. 44 : සෙමී 17 × 13. කබැ-බෝක:මිළ නොදැක්වේ. වයස අවු.10-14.

පණ්ඩිත හා අති පණ්ඩිත, යකඩ තරාදිය කෑ මීයෝ, වැලිකැටයක් අපට වටී, කට්ට හා වෙට්ට පිත්තල, රතුම රතු, මොනවද ඔට්ටු, හොඳ පාඩමක්, කාරුණික කුමාරයෙක්, පුංචි මාළුවෙක්, සහ තුට්ටු දෙකේ ලෝබයෙක් යන තුන් වැනි ලෝකයට අයත් පැරණි කතන්තර කීපයක එකතුවකි.




81. ජයවර්ධන, නිරෝෂා ප්‍රියදර්ශනී

පුංචි පුංචි ගී සීපද / නිරෝෂා ප්‍රියදර්ශනී ජයවර්ධන විසිනි. - කෑගල්ල (මාකුඹුර, හෙට්ටි මුල්ල): කොළිටි ප්‍රින්ටර්ස් (මුද්‍රණය), 1990. - පි. 12 : චිත්‍ර : සෙමී 24. කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.8-10.
ISBN 955-95247-0-4

ලේනා, නත්තල, සාමය, සමගිය, වීර මද්දුම බණ්ඩාර, හඳයා, මගේ රට, පාඩම්, කොක් හාමි යන කවි පන්තිවල එකතුවකි.

82. ජයවර්ධන, සෝමපාල




බුදු හාමුදුරුවෝ / සෝමපාල ජයවර්ධන විසිනි. –දෙහිවල (නැදිමාල): ශ්‍රී දේවි මුද්‍රණාලය, 1990. - පි. 12: චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝක : රු. 20.00. වයස අවු. 8-12.
ISBN 955-95044-3-6

බුදුන් වහන්සේ පිළිබඳව ලියැවුණු ළමා පොතකි.

83. ජයසූරිය, දයාරත්න




ලබු ගෙඩියේ තොවිලය / දයාරත්න ජයසූරිය විසිනි.- කොළඹ 6 (ඩබ්ලිව්. ඒ. සිල්වා මාවත): 'දසක' ප්‍රකාශන භාරය,1990.- පි. 12 : චිත්‍ර : සෙමී 24 × 17.
කබැ-බෝක : රු. 18.00. වයස අවු. 6-8.
ISBN 955-95260-0-6

ලබු ගෙඩියේ තොවිලය නම් ජන කථාව ආශ්‍රයෙන් ලියන ලද්දකි.

84. ඤාණසිරි හාමුදුරුවෝ, පොරවගම




වෙහෙරෙ - විහාරේ / පොරවගම ඤාණසිරි හාමුදුරුවෝ. - කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1990.- පි. 24 : චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝක : මිළ නොදැක්වේ.
වයස අවු. 8-12.
ISBN 955-5-0252-4

විහාරයකදී පිළිපැදිය යුතු සිරිත් සහ එහි දී දක්නට ලැබෙන දේ පිළිබඳ හැඳින්වීමක් මෙහි දැක් වේ.




85. ඩයස්, දො. ඩ.

ගුරු ගෙදරක කතාවː (ළමා නවකතාව) / දො. ඩ. ඩයස් විසිනි. –වේයන්ගොඩ (නො: 174/28, රණසිංහ මාවත) : ප්‍රභා ප්‍රකාශකයෝ සහ මුද්‍රණ ශිල්පියෝ (මුද්‍රණය), 1989. - පි. 73 : චිත්‍ර : සෙමී 21.

කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු. 10-12.

ISBN 955-95239-0-2

ලොතරැයි විකුණමින් හෝටලයක බරාදයක ජීවත් වූ දරුවකු ගුරු යුවලකගේ දරුවන් හා මිතුරු වී අවසානයේ එම පවුලෙහි දරුවකු ලෙස පාසැල් ජීවිතය ඇරඹූ ආකාරය යි.




86. ඩයස්, සිඩ්නි මාකස්

දිනුම් කුරුල්ලා / සිඩ්නි මාකස් ඩයස් විසිනි.- වරකාපොල (34, අඟුරුවල්ල පාර) : ආරිය මුද්‍රණ ශිල්පියෝ, 1988. - පි. 23 : චිත්‍ර : සෙමී 20 × 13.

කබැ-බෝක : රු. 15.00. වයස අවු. 8-10.

ISBN 955-95195-0-8

හොඳ නිවහනක් නැතිකමින් කුරුල්ලන් විඳින කරදර දකින රජාලියා ඔවුන් රැස් කරවා හොඳ කූඩුවක් හදන ආකාරය කියා දෙන සැටිත්, වඩු කුරුල්ලා හැර අනික් කුරුල්ලන් සමච්චලයෙන් ඉගිලී යන සැටිත්, මෙතෙක් කූඩුවක් සෑදීමට නොහැකිව කරදරයට පත්වන සැටිත් කියැවේ.




87. තලංගම, වයලා.

රත්තරන් ළමයි : (ළමා නවකතාව) / වයලා තලංගම විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්.ගොඩගේ, 1989. - පි. 63 : චිත්‍ර : සෙමී 18.

කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු. 12-14.

ISBN 955-95161-2-4

දෙවන ලෝක යුද්ධ සමය අළලා ලියැවුණ ග්‍රන්ථයකි. මිතුරන් තිදෙනකුගේ ජීවිතය යුද්ධය නිසා කොළඹින් පැමිණි දරුවන් දෙදෙනකු නිසා තරමක් වෙනස් වේ. මොවුහු ගැමියකුගේ උපදෙස් නිසා වගා කොට ආහාර සපයා ගනිති. මේ කථාව වටා ලියැවුණු ග්‍රන්ථයකි.



88. තිලකසිරි, සමන්

පුංචි මැණිකේ / සමන් තිලකසිරි විසිනි. – තලවතුගොඩ (261/42 හෝකන්දර පාර) : නව සමගි මුද්‍රණාලය, 1990. - පි. 67 : චිත්‍ර : සෙමී 21×14.
කබැ-බෝක : රු. 35.00. වයස අවු. 10-14.
ISBN 955-95130-4-4

නැකිරිගල, ලේ ගැලූ බුදු පිළිමය, කෙසෙල් කොළේ යුද උපාය, රජු සහ කවුඩා, කඳ කුමාර වරම, ඌරු දඩයම, නිහතමානී රජතුමා, පැණි වරකා බැය, දියවන්නා බිල්ල, බිලි පූජාවේ අභිරහස සහ පුංචි මැණිකේ යන ඓතිහාසික ජන කථාවල එකතුවකි.



89. තෙන්නකෝන්, ක්‍රිෂ්ණා

හොඳ ටිකිරි / ක්‍රිෂ්ණා තෙන්නකෝන් විසිනි. - කොළඹ 11 (217, ඕල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන, 1989.- පි. 17: චිත්‍ර: සෙමී 24.
කබැ- බෝක : රු. 21.00. වයස අවු. 6-7.
ISBN 955-21-0188-3


කුඩා දැරියකගේ යහපත් දින චරියාව හුවා දක්වමින් ආදර්ශවත්ව ඉදිරිපත් කර ඇති කථාවකි.



90. ද මැල්, ලාල් ප්‍රේමනාත්

අපූරු යාළුවෝ / ලාල් ප්‍රේමනාත් ද මැල් විසිනි. - කොළඹ 11 (217, ඕල්කොට් මාවත): එම්. ඩී. ගුණසේන, 1990. - පි. 94 : චිත්‍ර : සෙමී 18.
කබැ-බෝක: රු. 39.50. වයස අවු. 10-14.
ISBN 955-21-0136-0

ගල් ගුහාවක් තුළ දිය පාරක් හැරවීමෙන් ඇති වූ විවිධ ප්‍රතිඵල ද, අවසානයේ එය ගහක් හැරවීම දක්වා ව්‍යාප්ත වූ සැටි ද කියැවෙන කථාවකි.




91. ද මැල්, ලාල් ප්‍රේමනාත්
ගජමුතු : ශ්‍රී ලංකාවේ ගරු විධායක ජනාධිපති ආර්.ප්‍රේමදාස මැතිතුමාගේ ළමා කාලය අළලා යෞවන පාඨකයන් සඳහා ලියවුනු චරිත කතාවකි / ලාල් ප්‍රේමනාත් ද මැල් විසිනි. - බොරලැස්ගමුව : සීමාසහිත ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ (මුද්‍රණය), 1989. -පි. 93 : සෙමී 18.
කබැ-බෝ්ක : රු. 30.00. වයස අවු. 12-16.
ISBN 955-95142-5-3
ළමා කාලයත්, ජීවිතයේ කැපී පෙනෙන ගතිගුණත් අළලා ලියන ලද ප්‍රේමදාස මැතිතුමන්ගේ චරිත කථාවකි.



92. ද මැල්, ලාල් ප්‍රේමනාත්
මද්දුම බණ්ඩාර / ලාල් ප්‍රේමනාත් ද මැල් විසිනි. - කොළඹ 11 (217, ඔල්කොට් මාවත): ඇම්. ඩී.ගුණසේන, 1989. - පි. 57 : චිත්‍ර : සෙමී 18.
කබැ-බෝ්ක: රු. 24.50. වයස අවු. 8-10.
ISBN 955-21-0213-8

කුඩා කල සිට එඩිතර ගති දැක්වූ මද්දුම බණ්ඩාර මරණය ඉදිරියේ නොසැලී කඩුවට සිය ගෙල පෑ ආකාරය කියැවෙන පොතකි.



93. ද මැල්, ලාල් ප්‍රේමනාත්
වීර කැප්පෙටිපොළ / ලාල් ප්‍රේමනාත් ද මැල් විසිනි. - කොළඹ 11 (217, ඔල්කොට් මාවත): ඇම්.ඩී. ගුණසේන,1990.-පි. iv, 75: සෙමී 18.
කබැ-බෝ්ක: රු. 29.50. වයස අවු. 10-16.
ISBN 955-21-0477-7

මහනුවර රාජ්‍ය සමයේ ඓතිහාසික හා සමාජයීය තොරතුරු ද කැප්පෙටිපොළ මහ නිළමේගේ චරිතාපදානය ද මෙම ග්‍රන්ථයේ කියැවේ.



94\. ද මැල්, ලාල් ප්‍රේමනාත්
සෝමා දේවි / ලාල් ප්‍රේමනාත් ද මැල් විසිනි.– කොළඹ 11 (217, ඕල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන, 1990. - පි. 24: චිත්‍ර: සෙමී 18. කබැ-බෝක: රු. 15.00. වයස අවු. 8-12.
ISBN 955-21-0156-5

අනුරාධපුර යුගයේ විසූ සෝමා දේවියගේ චරිතය අළලා ලියැවුණු කෙටි කථාවකි.



95\. දල්පදාදු, රුවන් ශ්‍රී ලාල්
පුංචි හපනෙක් / රුවන් ශ්‍රී ලාල් දල්පදාදු විසිනි. - කොළඹ (තැ. පෙ. 1946) : කොළඹ පොත් සංගමය, 1989. - පි. 12 : චිත්‍ර : සෙමී 21.
කබැ.-බෝක: රු. 10.00. වයස අවු. 8-10.
ISBN 955-588-079-4

ඉගෙනීමට දක්ෂ කුඩා දරුවකු දුප්පත්කම නිසා සවස් කාලයේ දී ලොතරැයි විකිණීමට පටන් ගත් ආකාරය මේ පොතෙන් කියැවේ.



96\. ද ලැනරෝල්. වී. ඩී.
විධුර පණ්ඩිතයෝ / වී. ඩී. ද ලැනරෝල් විසිනි. - කොළඹ 11 (217, ඕල්කොට් මාවත): ඇම්. ඩී. ගුණසේන, 1989. - පි. 44 : චිත්‍ර : සෙමී 24.
කබැ-බෝක: රු. 35.00. වයස අවු 10-16.
ISBN 955-21-0352-5

බෝසතුන් විධුර පඬිව ඉපි ද දෙසන මනරම් දහම් අසනු රිසි විමලා නම් නාග බිසව ස්ත්‍රී මායම් යොදවා පූර්ණක යක්ෂයා ලවා එම පණ්ඩිතයන් ගෙන්වා ගත් සැටිත්, විධුර පඬිගේ දහම් අසා විමලාගේ දොළ සන් සිඳුණු සැටිත් දැක්වෙන කථාවකි. විධුර ජාතකය ආශ්‍රයෙන් ලියන ලදී.




97. ද ලැනරෝල්, වී. ඩී.

වෙස්සන්තර කථාව / වී. ඩී. ද ලැනරෝල් විසිනි. - කොළඹ 11 (217, ඔල්කොට් මාවත): ඇම්. ඩී.ගුණසේන, 1990. - පි. 27 : චිත්‍ර : සෙමී 24 × 17.
කබැ-බෝක : රු. 26.50. වයස අවු. 14-16.
ISBN 955-21-0484 - ×

වෙස්සන්තර රජු සිය රාජ්‍යය අතහැර වනයට ගොස් එහි දී සිය දරුවන් සහ දේවිය දන් දුන් කථාව මෙහි කියැවේ.




98. දළුවත්ත, මහින්ද

පුංචි ඔබට විද්‍යාව / මහින්ද දළුවත්ත විසිනි.- කොළඹ 11 (L.G.15, පීපල්ස් පාක්) : රුහුණු පොත් ප්‍රකාශකයෝ, 1990. - පි. 6 : චිත්‍ර : සෙමී 23 × 18.
කබැ-බෝක : රු. 18.50. වයස අවු. 10-11.

සූර්යයා සහ ගුරුත්වාකර්ෂණය විස්තර කරන සරල විද්‍යා ග්‍රන්ථයකි.




99. ද සිල්වා, අනුලා

යුග අභියෝග / අනුල ද සිල්වා විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර):ඇස්. ගොඩගේ, 1989. - පි. 112 : සෙමී 18.
කබැ-බෝක. : මිළ නොදැක්වේ.
වයස අවු. 12-16.
ISBN 955-20-0308-3

වාසනාව, අභියෝගය, කුසුමාවතීගේ මංගල්ලෙ, විවාහයෙන් පසු යන කෙටි කථා හතරේ එකතුවකි.



100. ද සිල්වා, ඇ. ලයනල්
සිහිති ඉණිමග 1 / ඇ. ලයනල් ද සිල්වා විසිනි. - දංකොටුව - සෙව්වන්දි ප්‍රකාශකයෝ, 1990.- පි. 36 : චිත්‍ර: සෙමී 20 × 15.
කබැ-බෝක : මිළ නොදැක්වේ.
වයස අවු. 4-5.

සිංහල හෝඩියේ අකුරු ලිවීම සහ කියවීම අභ්‍යාස කරවීම සඳහා පිළියෙල කරන ලද ග්‍රන්ථයකි.



101. ද සිල්වා, ඇ. ලයනල්
සිහිති ඉණිමග-2 / ඇ. ලයනල් ද සිල්වා විසිනි. -- දංකොටුව (මාවතගම) : සෙව්වන්දි ප්‍රාකාශකයෝ, (1990). - පි. 68 : චිත්‍ර : සෙමී 22.
කබැ-බෝක: රු. 20.00. වයස අවු. 14-16.

සිංහල හෝඩියේ අකුරු කියවීමට සහ ලිවීමට උගැන්වෙන පොතකි.



102. ද සිල්වා, ඇ. ලයනල්.
සිහිති ගායනා: ළදරු පන්ති සඳහා / ඇ. ලයනල් ද සිල්වා විසිනි. - [තැ.නො]: [ප්‍ර:නො. ],[දි.නො.].- පි.16 : චිත්‍ර: සෙමී 24.
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු. 6-7.


කුඩා දරුවන් සඳහා විවිධ තේමා යටතේ ලියැවුණු ගී එකතුවකි.

103. ද සිල්වා, ශ්‍රී චාල්ස්
උකුණයි ඉකිණියි: පැරණි සිංහල ජන කතාවක් / ශ්‍රී චාල්ස් ද සිල්වා විසිනි. - කොළඹ 11 (217, ඕල්කොට් මාවත): ඇම් ඩී. ගුණසේන, 1988.- පි. (11), 16: චිත්‍ර : සෙමී 25.
කබැ-බෝඩ්: රු. 20.00. වයස අවු. 6-8.
ISBN 955-21-0277-4



පැල් රකින්නට ගිය උකුණා පිළිසැසීම නිසා ඉකිණි ඇතුළු වෙනත් අය තම තමන් වෙත කර ගත් පාඩු කියන ජන කථාවකි.

104. ද සිල්වා, ශ්‍රී චාල්ස්
මැඩි අසුරුවා / ශ්‍රී චාල්ස් ද සිල්වා විසිනි. - කොළඹ 11 (217, ඕල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන, 1988. - පි. 41 : චිත්‍ර : සෙමී 23 × 18.
කබැ-බෝඩ් : රු. 29.50. වයස අවු. 9-11.
ISBN 955-21-0248-0


ශ්‍රී චාල්ස් ද සිල්වා

ගොවි දෙමහල්ලන්ගේ දරුවකු ලෙස ඉපදුණු මැඩියා දිසාපතිගේ දියණියක විවාහ කර ගන්නා සැටිත්, ඔහු සිය බිරියට හොරා තරුණයකුගේ වෙස් ගත් අවස්ථාවකදී ඇය මැඩි සැවය පුළුස්සා දැමූ සැටිත්, එයින් මැඩි තරුණයා මිය ගිය සැටිත් දැක්වේ.

105. ද සොයිසා, තාරකා
කිටියයි ටොමියයි / තාරකා ද සොයිසා විසිනි.– අම්බලන්ගොඩ (බර්ණගිරි වැල්ලමැද්ද, කුලීගොඩ):කර්තෘ, 1989. -පි.14 : චිත්‍ර : සෙමී 24.
කබැ-බෝඩ්: රු. 20.00. වයස අවු. 8-10.



කුඩා දරුවකු, බලු පැටියකු හා බළල් පැටියකු අතර පැවති මිතුරු දහම ගැන කියැවෙන කථාවක් සහිත මෙම ග්‍රන්ථය අට වසර පාසැල් සිසුවකුගේ කෘතියකි.




106.දිසානායක, එස්. ඒ.

බටකොළ ආච්චිගේ ලත්තෑරුම / එස්. ඒ. දිසානායක විසිනි. - නුගේගොඩ (72, ඩෙකා පැලස්, ස්ටැන්ලි තිලකරත්න මාවත) : පෙරළි ප්‍රකාශකයෝ, 1989. -පි. 20 : චිත්‍ර : සෙමී 28.
කබැ-බෝක : මිළ නොදැක්වේ. වයස අවු. 5-6.
ISBN 955-603-007-7

බූ බබා සහ බට කොල ආච්චි පිළිබඳ පින්තූර කථාවකි. කියවීමටත්, රූප පාට කිරීමටත් දරුවනට ඉඩ ලබා දෙයි.





107.දිසානයක, හියුබත්

කතා කමල / හියුබත් දිසානායක විසිනි. - කොළඹ 11 (217, ඕල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන,
1989. - පි. 24 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක: රු. 24.50. වයස අවු. 10-12.
ISBN 955-21-0339-8


ප්‍රචලිත උපමා කථා හතරක් පදනම් කොට ගෙන ලියැවුණු ග්‍රන්ථයකි.

108.දිසානායක , හියුබත්

කතා නුවණ / හියුබත් දිසානායක විසිනි. - කොළඹ 11 (217, ඕල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන,
1989. - පි. (11), 22 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක: රු. 29.75. වයස අවු. 8-12.
ISBN 955-21-0147-6



කොහාගේ පණිවුඩය-i සහ ii, වැඩි හපන්කම, ඇඹුල් මිදි, මෝඩ බල්ලා, ගොවියාගේ නුවණ යන කථා හය උපදේශාත්මකව ඉදිරිපත් කර ඇත.




109.දිසානයක, හියුබත්
විරයි ටිකිරයි / හියුබත් දිසානායක විසිනි. -
කොළඹ 11 (217, ඔල්කොට් මාවත) :
ඇම් ඩී. ගුණසේන, 1990. - පි. 14 :
චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝර්ක : රු: 22.50. වයස අවු. 6-8.
ISBN 955-21-0162-×

වනු පැටවකු, බල්ලකු සහ කුඩා දරුවකු පිළිබඳ කෙටි කථාවකි.




110.දිසානායක, හියුබත්
හීන් නුවණ / හියුබත් දිසානායක විසිනි. -
කොළඹ 11 (217, ඔල්කොට් මාවත) :
ඇම්. ඩී. ගුණසේන, 1989. - පි.22 :
චිත්‍ර : සෙමී 25.
කබැ-බෝර්ක: රු. 24.50 වයස අවු. 8-10.
ISBN 955-21-0127-1

සිංහයකුගේ අණින් වනයේ සතුන් එක බැගින් සිංහයාට ගොදුරු පිණිස ගිය සැටිත්, හාවකුගේ උපාය නිසා සිංහයා මරා සතුන් මරණයෙන් බේරා ගත හැකි වූ සැටිත් කියැවෙන කථාවක් මේ පොතේ අඩංගුය.



111.දොඩම්ගොඩ, ආරියරත්න
ටිං ටිං ටිං / ආරියරත්න දොඩම්ගොඩ විසිනි.-
පන්නිපිටිය· (94/1, අතුරුගිරිය පාර,
කොට්ටාව) : සාර ප්‍රකාශන සහ මුද්‍රණය,
1990. - පි. 8 : චිත්‍ර : සෙමී 24 × 18.
කබැ-බෝර්ක : රු. 17.50. වයස අවු. 6-8.
ISBN 955-90-96-00-1

ලේනාගේ පිටේ ඉරි තුනක් ඇන්ද කම්මල්කාරයකුගේ කථාව මෙහි දැක්වේ.



112.දොස්තයෙවුස්කිගේ, පියදෝර්
හදවතක ගීතය – A faint heart පියදෝර් දොස්තයෙවුස්කි විසිනි : පරිවර්තනය එච්. එම්. මොරටුවගම සහ නීල් ලකී ක්‍රිස්ටෝපර් විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර): ඇස්. ගොඩගේ, 1989. - පි. 86 : සෙමී 21.
තුබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.14-18.
ISBN 955-20-0338-5

තමාට පැවරුණු කාර්යය ඉවත දමා නිතර පෙම්වතිය බැලීමට යාමෙන් වැඩ අතපසු කළ වරදට තමාට දඩුවම් ලැබේය යි බියෙන් උමතු බවට පත් මිනිසකු පිළිබඳ කථාවක් මේ ග්‍රන්ථයෙන් කියැවේ.



113.ධම්බන්දු, ටී. ඇස්.
අපණ්ණක වණ්ණුපථ : ජාතක කථා / ටී. ඇස්. ධම්බන්දු විසිනි.- කොළඹ 11 (217, ඕල්කොට් මාවත): ඇම්. ඩී. ගුණසේන, 1989.- පි. (VIII), 24 : චිත්‍ර : සෙමී 24.
කබැ-බෝක: රු. 39.50. වයස අවු. 10-12.
ISBN 955-21-0310 - ×

ජාතක කථා සංග්‍රහයේ එන අපණ්ණක ජාතකය සහ වණ්ණුපථ ජාතකය ඇසුරෙන් ලියන ලද ග්‍රන්ථයකි.



114.ධම්බන්දු, ටී. ඇස්.
මහිංසාස කුමාරයෝ / ටී. ඇස්. ධම්බන්දු විසිනි. - කොළඹ 11(217, ඕල්කොට් මාවත): ඇම්. ඩී. ගුණසේන,
1989.- පි. 38 : චිත්‍ර : සෙමී 24.
කබැ-බෝක: රු. 38.50. වයස අවු. 12-14.
ISBN 955-21-0247-2

සිය පිය රජු සුළු මවට දුන් වරයක් ඉටු කිරීමට සිදුවීම නිසා මහිංසාස කුමරු වන වැදුණු ආකාරයත් එහි දී දිය රකුසකුට අසු වූ සිය සොහොයුරත් තම නැණ බලයෙන් බේරා ගත් ආකාරයත්, නැවත සිය රාජ්‍යයට උරුමය ලැබූ ආකාරයත් කියැවෙන ජාතක කථාවක් ඇසුරින් ලියන ලද ග්‍රන්ථයකි.




115.ධම්බන්දු, ටී. ඇස්.

සංඛ පණ්ඩිතයෝ / ටී. ඇස්. ධම්බන්දු විසිනි.- කොළඹ 11 (217, ඕල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන, 1989. - පි. (VI), 22: චිත්‍ර : සෙමී 24. කබැ-බෝර්ක: රු. 28.50. වයස අවු. 12-14. ISBN 955-21-0300-2


ධනවත් පවුලක උපන් සංඛ කුමරු ඉගෙනීම අවසන් කොට රජුගේ පුරෝහිතයා වූ සැටි ද දිනපතා දන් දීමෙන් ඔහුගේ ධනය අඩු වූ සැටි ද ධනය ඉපයීමේ අටියෙන් නැව් නැංග ද කුණාටුවකට අසුව මුහුදුබත් වූ සැටිත්, දෙවඟනකගේ උදව්වෙන් දිවි ද ගලවාගෙන ධනය ද ලබා ගත් සැටිත් කියැවෙන කථාවකි.




116.නවගත්තේගම, සයිමන්

හිමාල කන්ද තරණය කළ අර්ජුන කුමාරයාගේ කතන්දරේ / සයිමන් නවගත්තේගම විසිනි. - රත්මලාන (41, ලුම්බිණි මාවත): සර්වෝදය ග්‍රන්ථ ප්‍රකාශන සේවා, 1989.-පි.89: සෙමී 19. කබැ-බෝර්ක: මිළ නොදැක්වේ. වයස අවු. 14-16. ISBN 955-599-017-4

සිය පිය රජුගේ රාජ්‍යයේ ඇති වූ අර්බුද අවස්ථාවක දී වනයට ගෙන යනු ලැබූ අර්ජුන කුමාරයා යෝධයකු සිටි නිවසකට පැමිණෙයි. එහි දී අසනු ලැබූ කථාවකට අනුව රාවණ රජුගේ ඥාති දියණිය සහ ඇගේ සගයින්ගේ ප්‍රාණය සොයා හිමාලය කන්ද තරණය කොට, ආපසු සිය රටට ජයග්‍රාහීව පැමිණි අර්ජුන කුමාරයා සාර්ථක ලෙස රට පාලනය කරයි.




117.නවරත්න, තිලක

හිතලුගේ චාරිකාව / තිලක නවරත්න විසිනි.- කොහුවල (අංක 7, සුමනාරාම පාර) : උදය පබ්ලිකේෂන්ස්, 1990. - පි. 76 : චිත්‍ර : සෙමී 20 × 14. කබැ-බෝර්ක: මිළ නොදැක්වේ. වයස අවු. 8-12. ISBN 955-95271-0 - x


ජීවිතයට මුහුණ දීමේ දී ඇතිවන ගැටළු සාර්ථකව විසඳා ගැනීමට සුදුසු උපදෙස් ගැබ් වූ ළමා කතන්දර එකතුවකි.



118.පතිරාජ, ආරියවංශ

නත්තල් ගී / ආරියවංශ පතිරාජ විසිනි. -
කොළඹ 10 : ඇස්. ගොඩගේ, 1989. -
පි. 18 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝ්ක : මිළ නොදැක්වේ.
වයස අවු. 8-10.
ISBN 955-20-0350-4

කිතුණු බැති ගී එකතුවකි.



119.පතිරාජ, ආරියවංශ

නුවර වෙංකුවු / ආරියවංශ පතිරාජ විසිනි. -
කොළඹ 11 (217, ඕල්කොට් මාවත) :
ඇම්. ඩී. ගුණසේන,
1990. - පි. (14) : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝ්ක : රු. 22.50. වයස අවු. 6-7.
ISBN 955-21-0349-5

නුවර පෙරහැර වර්ණනා කරමින් ලියැවුණු ගී පොතකි.




120.පැලවත්ත, කුසුම්

සුදු සහ කළු / කුසුම් පැලවත්ත විසිනි. -
කොළඹ 05 : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,
1989. - පි. (15) : චිත්‍ර : සෙමී 24.
කබැ-බෝ්ක : රු. 15.00. වයස අවු. 8-10.
ISBN 955-610-001-6


අයියලා තිදෙනෙකු සිය හදා ගත් නැගණියට වෙනස්කම් කළ සැටිත්, ඔවුන්ගේ බැල්ලක සිය පැටවුන්ට මෙන් ම අහිත් බැල්ලකගේ ද පැටවුනට කිරි දෙන සැටි බලා සමගියේ අගය තේරුම් ගත් සැටිත් දැක්වෙන කථාවකි.




121.පියතිස්ස, හී. ග

හරි බැණා / හී. ග. පියතිස්ස විසිනි. - කොළඹ (තැ. පෙ. 1946) : කොළඹ පොත් සංගමය. 1989.- පි. 42 : සෙමී 18.
කබැ-බෝක: රු. 17.50. වයස අවු. 8-10.
ISBN 955-588-056-5

සිය දුවට ලොව ඉතාම බලවත් තැනැත්තා විවාහ කර දීමට ඉටා ගන්නා බළල් මව ඒ සඳහා ඉරු, වළාකුළු, සුළඟ, වේයා, ගවයා හා කොටියා හමු වී අවසානයේ බළල් තරුණයකු ම තෝරා ගන්නා හැටි කියැවෙන කතාවකි.




122.පියසේන, ධර්මසිරි

සිංහල ළමා කාව්‍ය විචාරය / ධර්මසිරි පියසේන විසිනි.- කොළඹ 10 (675, මරදාන පාර):ඇස්. ගොඩගේ, 1989.- පි.(4) VIII, 108: සෙමී 21.
තුබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.15-18.
ISBN 955-20-0317-0


ආනන්ද රාජකරුණා, ඇස් මහින්ද හිමි, කුමාරතුංග මුනිදාස, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ යන කවීන්ගේ ළමා කාව්‍ය හැඳින්වීමක් සහ විචාරයක් ද, සෙසු කවීන්ගේ ළමා කාව්‍ය හැඳින්වීමක් ද මේ ග්‍රන්ථයෙහි වේ.




123.පී. ඇම්. ජේ.

සිංහල මුල් පොත / පී. ඇම්. ජේ. විසිනි. - කොළඹ 12 (23, පීර් සායිබු වීදිය) : පී. ඇම්. ජේ. ප්‍රින්ටර්ස්, 1990. - පි. 10 :
චිත්‍ර : සෙමී 28 × 20.
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.4-5.

සිංහල හෝඩිය හඳුන්වා දීමකි.



124.පීරිස්, උපසේන

වසන්ත ළමා කඳවුර : සමීක්ෂණ වාර්තාව / උපසේන පීරිස් සහ චන්ද්‍රානි හිරිපිටිය විසිනි.- කොළඹ (තැ. පෙ. 1946) : කොළඹ පොත් සංගමය,1989.- පි(IV), 36 : චිත්‍ර : සෙමී 19. කබැ-බෝක: රු. 10.00. වයස අවු. 10-18. ISBN 955-588-069-7

1988 පවත්වන ලද වසන්ත ළමා කඳවුර පිළිබඳවත් එහිදී ඉදිරිපත් වූ තොරතුරු පිළිබඳ වාර්තාවකි.



125.පුංචි පුංචි තාරකා. / කොළඹ 02 : විජය ප්‍රකාශන සමාගම, 1989. - පි. 16 : චිත්‍ර : සෙමී 27. කබැ-බෝක: රු. 10.00. අවු. 6-8. ISBN 955-9067-00-1


අඹ හොරා, බිංදු බිංදු, පිණි වැටිලා, සායම් මුට්ටිය තෙමී තෙමී යන බක බක නයිදේ, ගහකින් වැටිලා අත්තටු බිඳිලා, කුඹී අයිති කාටදෝ, සරුංගලෙත් ඇඩුවා, කොක්කු රැන් රැන් රැන්, නිත්දෙන් නැගිටලා බැලුවා, පුස්රාලට හෙම්බිරිස්සාවක්, කෝච්චියක් එනවා යන මාතෘකා යටතේ ලියන ලද ගැදි පැදි එකතුවකි.




126.පෙරේරා, අරෝෂා දේවකී

විරාමයක කල්පනා / අරෝෂා දේවකී පෙරේරා විසිනි. - කොළඹ 10 (675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1990. - පි. 23 : සෙමී 20 × 13. කබැ-බෝක: මිල නොදැක්වේ. වයස අවු.8-10.

ළමා මනසට සමීප මාතෘකා කීපයක් මත ලියැවුණු කවි එකතුවකි.




127. පෙරේරා, ඇම්. උදිත පුෂ්පාංජලී
ගේ කුරුල්ලෝ /ඇම්. උදිත පුෂ්පාංජලී පෙරේරා විසිනි. - කොළඹ (තැ.පෙ. 1946) : කොළඹ පොත් සංගමය, 1989.- පි. 12 :
චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක: රු. 15.00. වයස අවු. 8-10.
ISBN 955-588-075-1

තම ආහාරයට වී ටිකක් නුදුන් නිසා කපුටා ගේ කුරුල්ලාගේ බිත්තර කා දැමූ සැටිත් ගේ කුරුල්ලාට හිරිහැර කරන සැටිත් අන්තිමේදී ගේ කුරුල්ලා මිනිසුන් සමඟ ජීවත් වීමට ආ සැටිත් මේ කථාවෙන් කියැවේ. හත වසර සිසුවකු විසින් ලියන ලද්දකි.



128. පෙරේරා, ටී. ඩී. පුෂ්පලතා
කහ සමනලයා / ටී. ඩී. පුෂ්පලතා පෙරේරා විසිනි. - කොළඹ 10 (181, 1 වැනි මරදාන): කොළඹ විජය මුද්‍රණාලය, 1988. - පි. 6:
චිත්‍ර : සෙමී 25.
(විජය ළමා පොත් : අංක 1).
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු.6-8.

සතුන්ට හිංසා කිරීම වැරදි බව ළමයින්ට අවබෝධ කරවන කථාවකි.




129. පොන්සේකා, කුලසේන
රංසිරිගේ සංග්‍රාමය / කුලසේන පොන්සේකා විසිනි. - කැළණිය (ලියෝ මාවත, සිංහාරමුල්ල): ශීලා ප්‍රින්ටින් වර්ක්ස් (මුද්‍රණය), 1989. - පි. 240 : සෙමී 18.
කබැ-බෝක: රු. 55.00. වයස අවු. 14-16.
ISBN 955-95200-0-8

තමා අතින් සිදු වන වරදක් නිසා නගරයට පැන යන ගැමි දරුවකු එහි දී ලද අත්දැකීම් ද, එම අත්දැකීම් නිසා සිය ජීවිතය සාර්ථක කර ගන්නා ආකාරය ද විස්තර වන කතාවකි.

130. ප්‍රනාන්දු, ආතර් ජෝ.



හංසයන් හයදෙනා / ආතර් ජෝ. ප්‍රනාන්දු විසිනි. - කොළඹ 10 ( නො: 675, මරදාන පාර) : ඇස්. ගොඩගේ, 1989. - පි. 20 : චිත්‍ර : සෙමී 25.
කබැ-බෝක: මිළ නොදැක්වේ. වයස අවු. 8-10.
ISBN 955-20-0267-2

මායාකාර කුඩම්මාගේ සාපය නිසා හංසයන් බවට පත් වූ තම සහෝදරයන් හය දෙනා බේරා ගැනීමට හය වසරක් කථා නොකර කර දර මැද ජීවිතය ගෙවූ කුමරියක පිළිබඳ කථාවකි.

131.ප්‍රනාන්දු කේ. පී.




ගුණසේන පාට කිරීමේ පොත / කේ. පී. ප්‍රනාන්දු විසිනි. –කොළඹ 11 (217, ඔල්කොට් මාවත) : ඇම්. ඩී. ගුණසේන, (1989). - පි. 20 : චිත්‍රපත්: 19 : සෙමී 25.
කබැ-බෝක: රු. 29.50. වයස අවු. 5-6.

පාට කිරීම සඳහා ඉදිරිපත් කළ පින්තූර සහිතය.

132 ප්‍රනාන්දු, ඩබ්ලිව්. ඕ. ටී.



ඩිංග නුවණ / ඩබ්ලිව් . ඕ. ටී. ප්‍රනාන්දු විසිනි.– දෙහිවල (ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මාවත) : ගිහාන් පොත් හල, 1990. -පි. [IV]: සෙමී 30.
කබැ-බෝක: රු. 20.00. වයස අවු. 6-8.
ISBN 955-593-034-1

කුකුලන් කෑමට පුරුදු වී සිටි නරියකු කොහොල්ලෑ කුකුලකු තබා අල්ලා ගත් ළමයකු පිළිබඳ කථාවකි.




133.ප්‍රනාන්දු, ඩබ්ලිව්. ඕ. ටී.

මැටි කෝප්පය / ඩබ්ලිව්. ඕ. ටී. ප්‍රනාන්දු විසිනි. - දෙහිවල (144 සී, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත) : ගිහාන් පොත් හළ, 1990. - පි. 10 : චිත්‍ර : සෙමී 28 × 22. කබැ-බෝක : රු. 20.00. වයස අවු. 6-8.

ISBN 955-593-020-1

තම මහළු මවට නොසැලකූ තම පියා සහ මව එබඳු ම සැලකීම් ලබනු ඇතැයි පෙන් වූ දරුවකුගේ කථාවක් මෙයින් කියැවේ.




134.ප්‍රේමරත්න, කුසුමා

වෙනස / කුසුමා ප්‍රේමරත්න විසිනි. -ගනේමුල්ල (360 /2 කැන්දලියද්දපාළුව) : චලිත මුද්‍රණාලය (මුද්‍රණය), 1990. - පි. 16 : චිත්‍ර : සෙමී 25. කබැ-බෝක: රු. 18.00. වයස අවු 8-10.

ISBN 955-95316-0-3

අළුත් පන්තියකට ගිය කුඩා දරුවකු නව ගුරුවරිය පිළිබඳව ඇති කර ගත් ආකල්පය පිළිබඳව කියැවෙන කථාවක් මෙම පොතෙහි එයි.




135.ප්‍රේමරත්න කේ. පී.

අලුත් යාලුවෝ / කේ. පී. ප්‍රේමරත්න විසිනි.- කිරිඳිවැල, ප්‍රින්ටර්ස් (මුද්‍රණය), 1989. - පි. 12 : චිත්‍ර : සෙමී 24 × 18. කබැ-බෝක : රු. 12.50. වයස අවු. 6-8.

